# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

## 2004 අංක 8 දරන මුදල්
## (සංශෝධන) පනත

---

[සහතිකය සටහන් කළේ **2004** ඔක්තෝබර් මස **05** වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

2004 ඔක්තෝබර් මස 08 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
ගැසට් පත්‍රයේ **II** වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 1, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකිය.

මිල **:** රු. **5.50** යි. තැපැල් ගාස්තුව **:** රු. **4.50** යි.

## 2004 අංක 8 දරන මුදල් (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 2004 ඔක්තෝබර් මස 05 වන දින]

එල්.ඩී.—ඕ. 13/2004

**2002 අංක 11 දරන මුදල් පනත සංශෝධනය කිරීම සඳහා ද, 1963 අංක 11 දරන මුදල් පනතේ VI වන කොටස, 2002 අංක 11 දරන පනත මගින් ඉවත් කර තිබුන ද, ඒ නොතකා 1963 අංක 11 දරන පනතේ එම කොටස ක්‍රියාත්මකව පවතින බවට විධිවිධාන සැලැස්වීම සඳහා ඊට සහ ඒ හා සම්බන්ධ හෝ ඊට ආනුෂංගික කරුණු සඳහා විධිවිධාන සලැස්වීම පිණිස ද වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

**1.** මේ පනත, 2004 අංක 8 දරන මුදල් (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. (ලුහුඬු නාමය.)

I වන කොටස

### පොදු විධිවිධාන

**2.** 2002 අංක 11 දරන මුදල් පනත, ඒ පනතේ IV වන කොටස (19 හා 20 වන වගන්ති) ඉවත් කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ. (2002 අංක 11 දරන පනත සංශෝධනය කිරීම.)

II වන කොටස

### 1963 අංක 11 දරන පනතේ VI වන කොටස නැවත පැනවීම

**3.** වරින් වර සංශෝධිත පරිදි වූ 1963 අංක 11 දරන මුදල් පනතේ VI වන කොටස, 2002 අංක 11 දරන මුදල් පනතේ IV වන කොටසේ විධිවිධාන මගින් ඉවත් කරනු ලැබුව ද ඒ නොතකා, 1963 අංක 11 දරන මුදල් පනතේ VI වන කොටසේ (58 සිට 66 දක්වා වගන්ති) විධිවිධාන, මේ පනතේ විධිවිධාන ක්‍රියාත්මකවීම ආරම්භ වන දිනයේ සිට, මේ පනතින් පනවනු ලැබුවාක් සේ ක්‍රියාත්මක විය යුතු ය. (1963 අංක 11දරන මුදල් පනතේ **VI** වන කොටසේ විධිවිධාන ක්‍රියාත්මකව පැවතිය යුතු බව.)

(2) වරින්වර සංශෝධිත පරිදි වූ 1963 අංක 11 දරන මුදල් පනතේ VI වන කොටසේ විධිවිධාන, (58 සිට 66 දක්වා වූ වගන්ති) මේ වගන්තියේ (1) වන උපවගන්තියේ විධිවිධානවලට අනුව ක්‍රියාත්මක වූ විට, වරින් වර සංශෝධිත පරිදි වූ ඉහත සඳහන් පනතේ VI වන කොටස හා සම්බන්ධව සාදනු ලැබ තිබෙන සියලු නියමයන්, නිවේදන, රීති හෝ නියෝග, මේ පනතේ විධිවිධාන ක්‍රියාත්මකවීම ආරම්භ වන දිනයේ සිට

2-H 022824- 5,000 (2004/08)

බලපවත්වන පරිදි, VI වන කොටසේ විධිවිධාන නැවත ක්‍රියාත්මකවීමත් සමග, ඒ නියමයන්, නිවේදන, රීති හෝ නියෝග මෙහි ලා පනවනු ලැබුවාක් සේ ක්‍රියාත්මක වන්නේ ය.

1963 අංක 11 දරන පනත සංශෝධනය කිරීම.

4. 1963 අංක 11 දරන මුදල් පනතේ VI වන කොටස, මෙහි පහත දැක්වෙන පරිදි මින් සංශෝධනය කරනු ලැබේ :—

(1) ඒ පනතේ 58 වන වගන්තිය—

(අ) එහි (1) වන උපවගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් උපවගන්තිය ඇතුළත් කිරීමෙන් :—

"(1අ) ශ්‍රී ලංකාවේ පුරවැසියකු නොවන තැනැත්තකුට ශ්‍රී ලංකාවේ කිසිම දේපළක අයිතිය පැවරීමක් අවස්ථාවෝචිත පරිදි යම් පරිපාලන දිස්ත්‍රික්කයක, ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයක හෝ ග්‍රාම නිලධාරි කොට්ඨාසයක ඉඩම්වලට පවත්නා මිළ සැලකිල්ලට ගෙන, ඉඩම් අමාත්‍යවරයාගේ සහ ප්‍රධාන තක්සේරුකරුගේ එකඟත්වය ඇතිව මුදල් අමාත්‍යවරයා විසින් තත් කාර්යය සඳහා සාදනු ලබන නියෝග මගින් නිශ්චිතව නියම කරන යම් වටිනාකමකට අඩු මිළකට, සිදු නොකළ යුතු ය.";

(ආ) එහි (3) වන උපවගන්තියට ඉක්බිතිව ම, පහත දැක්වෙන අලුත් උපවගන්තිය එකතු කිරීමෙන් :—

"(3අ) ශ්‍රී ලංකාව ඇතුළත පිහිටි යම් දේපළක අයිතිය සමාගමකට පැවරීමක් සිදුවන අවස්ථාවක දී, ඒ සමාගමේ නිකුත් කළ කොටස්වලින් සියයට විසිපහකට වැඩි ප්‍රමාණයක් ශ්‍රී ලංකා පුරවැසියන් නොවන තැනැත්තන්ට අයත්ව ඇත්නම්, ඒ දේපළෙහි වටිනාකමට සමාන මුදල් ප්‍රමාණයක බද්දක්, ඒ දේපළෙහි පැවරුම්ලාභියාගෙන් අයකර ගත යුතු ය.". ;

(ඇ) එහි (4) වන උපවගන්තියේ (උ) ඡේදය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන ඡේදය ආදේශ කිරීමෙන් :—

"(උ) අමාත්‍යවරයා විසින් කරන ලද නියමයක් මගින් නිශ්චිතව නියම කර ඇති එවැනි යම් පන්තියකට හෝ විස්තරයකට අයත්

යම් දේපළක් පැවරීම කෙරෙහි හෝ එසේ නියම කර ඇති යම් තැනැත්තකුට, පුද්ගල මණ්ඩලයකට හෝ පුද්ගල ගණයකට දේපළ පැවරීම. ඒ සෑම නියමයක්ම ගැසට් පත්‍රයෙහි පළ කරනු ලැබිය යුතු ය.". ; සහ

(2) ඒ පනතේ 66 වන වගන්තියට ඉක්බිතිව ම, එහි 66අ වගන්තිය ලෙස බලපැවැත්විය යුතු, මෙහි පහත දැක්වෙන අලුත් වගන්තිය ඇතුළත් කිරීමෙන් :—

"නියෝග

66අ. (1) මේ පනතේ ප්‍රතිපත්ති හා විධිවිධාන ක්‍රියාවේ යෙදීමේ හෝ බලාත්මක කිරීමේ කාර්ය සඳහා සහ නියම කරනු ලැබිය යුතු යයි මේ පනතින් නියමිත කාරණා සම්බන්ධයෙන් අමාත්‍යවරයා විසින් නියෝග සාදනු ලැබිය හැකි ය.

(2) ඒ සෑම නියෝගයක් ම ගැසට් පත්‍රයේ පළ කළ යුතු අතර එසේ පළ කරනු ලැබූ දිනයේ දී හෝ නියෝගයෙහි නිශ්චිතවම නියම කරනු ලබන යම් පසු දිනයක දී හෝ ක්‍රියාත්මක වන්නේ ය.

(3) ගැසට් පත්‍රයේ පළ කරනු ලැබීමෙන් පසු ඒ සෑම නියෝගයක් ම අනුමතිය සඳහා හැකිතාක් ඉක්මණින් පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු ය. එසේ අනුමත කරනු නො ලැබූ යම් නියෝගයක් ඒ යටතේ ඊට පූර්වයෙන් කරන ලද කිසිවකට අගතියක් නොමැතිව, එම අනනුමතයේ දින සිට පරිච්ඡින්න කරන ලද සේ සැලකිය යුතු ය.

(4) නියෝගයක් පරිච්ඡින්න කරනු ලැබූ ලෙස සැලකෙන දිනය ගැසට් පත්‍රයේ පළ කරනු ලැබිය යුතු ය.".

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

**5**. මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇති වුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 870 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 32, ට්‍රාන්ස්වර්ක්ස් මන්දිරය, ලෝටස් පාර, කොළඹ 01, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.